දෙපාර්මේන්තු චක්‍රලේඛ අංකය: 21/2014

බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09
2014-06-13

සියලුම බන්ධනාගාර අධිකාරීවරුන්/ සහකාර අධිකාරීවරුන් වෙත,

* 260 - 281 දක්වා වන දෙපාර්තමේන්තු නිත්‍ය නියෝගවලට වැඩිමනත් වශයෙනි.

**ගිනි අවි ගබඩා කිරීම හා ශුද්ධ පවිත්‍ර කිරීම**

බන්ධනාගාර ආයතනවල භාවිතය සඳහා ලබාදී තිබූ ගිනි අවි නියමිත ආකාරයෙන් ගබඩා කිරීම හා ශුද්ධ පවිත්‍ර කිරීම සිදු නොවීම හේතුවෙන් එම ගිනි අවිවල කල් පැවැත්මට හානි වූ බව පසුගිය කාල වකවානුවේදී භාවිත කල ගිනි අවි යුධ හමුදා අනු කණ්ඩයට භාර දීමේදී පැහැදිලිව පෙනී ගිය කරුණකි. එසේ හෙයින් ඉදිරියේදී ගිනි අවි භාවිතය සම්බන්ධයෙන් පහත සඳහන් උපදෙස් පිළිපැදිය යුතු බව දන්වමි.

01- ගිනි අවි ගබඩා කිරීම

I ගිනි අවි ගබඩා භාරව ජේලර්වරයෙකු හා සැරයන්වරයෙකු යෙදවිය යුතු අතර ගිනි අවි සම්බන්ධයෙන් පුහුණුවක් ඇති නිළධාරීන් තෝරා පත්කල යුතුය. මොවුන් හමුදා සේවයේ හෝ පොලිස් සේවයේ නිරතවූවන් නම් වඩාත් සුදුසුය.

II ගිනි අවි නිකුත් කිරීමෙන් පසු නැවත භාර ගැනීමේදී නිසි ක්‍රියාකාරීත්වයෙන් යුක්තදැයි නිවැරදිව පරීක්ෂා කර බැලිය යුතුය. කිසියම් ආකාරයක දෝෂයක් වේ නම් ඒ සම්බන්ධයෙන් අදාළ නිළධාරියාගෙන් කරුණු විමසා මා වෙත වාර්තා කල යුතුය.

III භාරගන්නා ලද ගිනි අවි නිවැරදි අයුරින් අවි රඳවනයන් තුළ තැබීමට අවි භාර නිළධාරියා සැළකිලිමත් විය යුතුය.

IV නිකුත් කරන ලද පතරොම් නැවත භාර ගැනීමේදී නිසි තත්ත්වයෙන් තිබේදැයි පරීක්ෂා කර භාර ගත යුතුය. යම් ආකාරයක වෙනසක් වේ නම් ඒ සම්බන්ධයෙන් කරුණු විමසා සටහන් තබා මා වෙත වාර්තා කල යුතුය.

V භාර ගන්නා ලද පතරොම් තැන්පත් කිරීම අවි භාර නිළධාරියා නිවැරදිව ඉටුකල යුතුය.

VI ගිනි අවි ගබඩාව පිරිසිදුව පවත්වාගෙන යාම කල යුතුය.

02- ශුද්ධ පවිත්‍ර කිරීම

I සියලු ගිනි අවි සම්බන්ධයෙන් මනා පුහුණුවක් ලත් නිළධාරීන් ශුද්ධ පවිත්‍ර කිරීම සඳහා යෙදවිය යුතුය.

II ගිනි අවි සතියකට එක් වතාවක් (ඉරිදා දින) ශුද්ධ පවිත්‍ර කිරීම අවි භාර ජේලර්වරයා සතු වගකීමකි.

III ශුද්ධ පවිත්‍ර කිරීමේදී ගිනි අවිවල යම් දෝෂයක් ඇත්නම් වහාම ඒ සම්බන්ධයෙන් රපෝර්තු කර අවශ්‍ය අලුත්වැඩියා කටයුතු සඳහා යොමුකල යුතුය.

IV ශුද්ධ පවිත්‍ර කිරීම සඳහා අවශ්‍ය මෙවලම් හා ලිහිසි තෙල් (නියමිත ප්‍රමිතියෙන් යුත්) භාවිතයේදී ප්‍රවේශමෙන් හා අපතේ නොයන පරිදි කටයුතු කිරීමට අදාළ නිළධාරීන් දැනුවත් කල යුතුය.

V මෙම කාර්යයන් ඉටු කිරීමේදී යම් අපහසුතාවක් ඇත්නම් කඩිනමින් මා වෙත වාර්තා කර අවශ්‍ය උපදෙස් හා ප්‍රතිපාදන ලබා ගැනීමට කටයුතු කල යුතුය.

03- I ගිනි අවි නිකුත් කල පසුව, යම් හේතුවක් නිසාවෙන්, උණ්ඩ පාවිච්චි කිරීමට සිදුවුවහොත් ඊට හේතු වූ කරුණු පිළිබඳ ගිනි අවිය භාරගත් නිළධාරියාගෙන් කරුණු විමසා වාර්තා කලයුතු අතර අනිවාර්යයයෙන් මූලික විමර්ශනයක් කර ඔබගේ නිර්දේශය සමග වාර්තාව ඉදිරිපත් කල යුතුය. එම හේතුව නිසාවෙන් එම ගිනි අවිය පරීක්ෂණ කටයුතු සඳහා ඉදිරිපත් කර තිබේනම් මේ සියලු වාර්තා ගොනුකර ආරක්ෂා සහිතව තැබිය යුතු අතර ඉදිරි වර්ෂයන් පාසා එම වාර්තාව යතාවත් කල යුතුය.

II යම් නිළධාරියෙකු වෙත ගිනි අවියක් නිකුත් කල පසු එම ගිනි අවිය අස්ථාන ගතවී ඇත්නම් ඒ පිළිබඳ සියලු කරුණු සටහන් කර වාර්තාව මා වෙත වාර්තා කල යුතුය. එම සිදුවීම සම්බන්ධව වර්ෂයන් පාසා යතාවත් කල යුතුය. ගිනි අවි අස්ථානගත වීම සම්බන්ධ පූර්ණ වාර්තාවක් අවි භාරගත් නිළධාරීන්ගෙන් ලබාගෙන (දෙපාර්තමේන්තු නිත්‍ය නියෝග අනුව) පොලිසිය හෝ අදාල ආරක්ෂක අංශ වෙත පැමිණිලි කොට මූලික විමර්ශනයක් කර වාර්තා කල යුතුය.

III සෑම අධිකාරීවරයෙකුම තමාට අවශ්‍යවන්නා වූ පරිදි දෙපාර්තමේන්තු නිත්‍ය නියෝග සහ මෙම කෙටුම්පත ප්‍රකාරව ගිනි අවි භාවිතය, නඩත්තුව හා රැකගැන්ම ඇතුළත් ගිනි අවි නියෝගයක් නිකුත් කර එහි පිටපතක් බන්ධනාගාර බුද්ධි හා ආරක්ෂක ඒකකය වෙත එවිය යුතුය.

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්